**President**
*Ruwan Dissanayake*
*District Judge - Kegalle*

**Vice Presidents**
*Janaka Kekirideniya*
*Addl.District Judge - Colombo*

*Lochani Abeywickrama*
*Magistrate - Maligakanda*

**Secretary**
*Isuru Neththikumarage*
*Magistrate - Galle*

**Asst. Secretary**
*Nayantha Samarathunge*
*District Judge - Ratnapura*

**Treasurer**
*Sampath Gamage*
*Addl. District Judge - Kalutara*

**Editor**
*Nuwan Kaushalya*
*Addl. Magistrate - Kurunegala*

**Asst. Editor**
*Minodi Hewawasam*
*Addl. Magistrate - Anuradapura*

**Webmaster**
*Darshima Premaratne*
*Addl. Magistrate - Negambo*

# Judicial Service Association of Sri Lanka

## <u>මාධ්‍ය නිවේදනය</u>

2024.06.19 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විවාදයක් අතරතුරදී අධිකරණ අමාත්‍යවරයා විසින් අධිකරණ පද්ධතිය නිර්දය විවේචනයට ලක් කරමින් ඉදිරිපත් කරන ලද වගකීම් විරහිත ප්‍රකාශයන් පිළිබඳව ශ්‍රී ලංකාවේ දිසා විනිශ්චයකාරවරුන්ගෙන් හා මහෙස්ත්‍රාත්වරුන්ගෙන් සමන්විත වන ශ්‍රී ලංකා අධිකරණ සේවා සංගමයේ දැඩි අවධානය යොමු වී ඇත.

සමස්ථ අධිකරණ පද්ධතියට බලපෑම් වන පරිදි ඉදිරිපත් කරන ලද එම විවේචනයන් අසත්‍යයෙන් සත්‍යය වෙන් කර නොගෙන ප්‍රතිපාර්ශ්වයන් විසින් දේශපාලනමය වශයෙන් තමන්ගේ පැවැත්ම අභියෝගයට ලක් කර ඇති නඩුකරයන් වලදී අදාල අධිකරණයන් විසින් නීතියට අනුකූලව නිකුත් කරන ලද තීන්දු හා නියෝග වලින් අතෘප්තියට පත් වීම මතම සැලැසුම් සහගතව සිදුකරන ලද්දක් බව අපගේ නිරීක්ෂණයයි. යම් අධිකරණ තීරණයකින් අතෘප්තියට පත් වන පාර්ශ්වයක් ව්‍යවස්ථාපිත අභියාචනා කාර්යපටිපාටිය වෙත යොමු නොවී මහජනතාවගේ පරමාධිපත්‍යය ක්‍රියාත්මක කරන එක් කුළුණක් වන උත්තරීතර ව්‍යවස්ථාදායකය භාවිතා කර ස්ථාවර නියෝග 91(ඊ) වගන්තිය මගින් පවතින නඩුවකට බලපෑම් වන පරිදි අදහස් ප්‍රකාශ කිරීම වළක්වා තිබීම නොසළකා පාර්ලිමේන්තු වරප්‍රසාද වලට මුවා වී එකී මහජනතාවගේ පරමාධිපත්‍යය බලය ක්‍රියාත්මක කරන තවත් කුළුණක් වන අධිකරණය වෙත ද්වේෂසහගත ලෙස විවේචන එල්ල කිරීම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් සඳහා අත්‍යාවශ්‍ය පදනමක් වන අධිකරණයේ ස්වාධීනත්වය ප්‍රසිද්ධියේ අභියෝගයකට ලක් කිරීමක් ලෙස අපි දකිමු.

අපක්ෂපාතී විනිශ්චයකාරවරුන් අපකීර්තියට පත් කිරීම සඳහා වූ නිශ්චිත ඉලක්කගත ව්‍යාපෘතියක් කොටස් වශයෙන් දිගහැරෙමින්

පවතින බව අප සංගමය නිරීක්ෂණය කරමින් ඇති බවද අධිකරණ පද්ධතියට එල්ල වන බාහිර බලපෑම් වළක්වා එහි යහපැවැත්ම උදෙසා වැදගත් තීරණයන් ගනු ලැබූ විනිශ්චයකාරවරුන් ස්ථාන මාරු වී ගිය පසු ඔවුන්ට පෞද්ගලිකව අපකීර්තියක් ඇති වන මතවාද නිර්මාණය කිරීම එහි එක් පියවරක් වශයෙන් සිදුවෙමින් පවතින බවද එහි අවසාන අරමුණ විනිශ්චයකාරවරුන් නිර්භීතව හා අපක්ෂපාතීව අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් බලවත් ලෙස පෙනී සිටීම වළක්වා බාහිර බලවේගයන්ට අවශ්‍ය ආකාරයට මෙහෙයවිය හැකි දුර්වල තත්ත්වයකට පත් කිරීම බවද එහිදී මූලික වශයෙන් කොළඹ හිටපු ප්‍රධාන මහෙස්ත්‍රාත්වරයා හා ගල්කිස්ස හිටපු මහෙස්ත්‍රාත්වරයා ඉලක්ක කරමින් ඇති බවට අනාවරණය වී ඇති බවද අප සංගමය 2024.05.07 වන දින අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ලිඛිතව වාර්තා කරන ලදී.

එයට සමගාමීව ඉතිහාසය පුරා විවිධ අවස්ථාවන් වලදී අඩු වැඩි වශයෙන් මුල් අවස්ථා අධිකරණ කටයුතු වලට එල්ල වූ බාහිර බලපෑම් විනිශ්චයකාරවරුන්ට සන්නිවේදනය වීම නතර කරන ලද පුද්ගලයා වන අධිකරණ සේවා කොමිෂන් සභාවේ වර්තමාන ලේකම්වරයා එම තනතුරෙන් ඉවත් කිරීම සඳහා ව්‍යාජ මතවාද නිර්මාණය කිරීමේ ව්‍යාපෘතියක්ද ක්‍රියාත්මක වෙමින් ඇති බව අප නිරීක්ෂණය කර තිබුණි. මුල් අවස්ථා අධිකරණ වල තීරණයන් තමන්ට අවශ්‍ය පරිදි හසුරුවා ගැනීමට අවශ්‍ය වූ සියලු දූෂිත බලවේගයන් විටින් විට ඔහුව ඉලක්ක කිරීමේ අවස්ථාවන් කිහිපයක් මීට පෙරද අප විසින් කල් තබා නිරීක්ෂණය කර පරාජයට පත් කර තිබේ. තීරණාත්මක අවස්ථාවන්හිදී එම උත්සාහයන් නව මුහුණුවරකින් නැවත නැවත ඉදිරිපත් විය හැකි බවට අප දැන සිටි අතර අධිකරණ පද්ධතියට එල්ල වන බාහිර බලපෑම් වලින් විනිශ්චයකාරවරුන් ආරක්ෂා කර ගැනීමට බලවත් සහ වෙහෙසකාරී කාර්යභාරයක් ඉටු කරමින් සිටින ලේකම්වරයා ආරක්ෂා කිරීමට අප සංගමය කොන්දේසි විරහිතව හා ඒකමතිකව පෙනී සිටින්නෙමු. ශීර්ෂගත පාර්ලිමේන්තු විවාදයේදී අධිකරණ අමාත්‍යවරයා විසින් තම නිර්දය විවේචනයන්ට පාදක කර ගනු ලැබුවේද සමහරක් සමාජ මාධ්‍යයන් හරහා නිර්මාණය කරමින් තිබෙන්නේ යැයි අප විසින් පූර්වාපේක්ෂණය කරන ලද එම කරුණුම වේ.

අධිකරණ අමාත්‍යවරයා යනු අධිකරණයේ සාමාජිකයෙකු නොවුනද වෙස්ට්මින්ස්ටර් පාර්ලිමේන්තු ආකෘතිය තුල අධිකරණයේ ස්වාධීනත්වයට හා යහපැවැත්මට එල්ල වන බාහිර බලපෑම් වලදී විනිශ්චයකාරවරුන්ට තම වෘත්තීයේ උසස් සම්ප්‍රදායන් හේතුවෙන් ඒවාට එරෙහිව ප්‍රසිද්ධියේ ක්‍රියා කිරීමට නොහැකි වීම මත ව්‍යවස්ථාදායකය හෝ විධායකය තුලදී හා ඉන් පිටතදී අධිකරණ පද්ධතියේ ගෞරවය ආරක්ෂා කරන පුද්ගලයා බවට සාම්ප්‍රදායිකව පත්ව සිටියේ ඔහුය. එවැනි නීතියේ පාලනය උදෙසා වැදගත් හා සංවේදී වගකීමක් දරණ තැනැත්තෙකු අධිකරණය ඉදිරියේ විනිශ්චයට

භාජනය වී ඇති නඩුකරයක පාර්ශ්වකරුවෙකු වී එහි තීරණයෙන් අතෘප්තියට පත් වීම හේතුවෙන්ම උත්තරීතර පාර්ලිමේන්තු සභාව තුලදී අධිකරණ පද්ධතිය හෑල්ලුවට ලක්වන ප්‍රකාශයන් නිකුත් කිරීම ව්‍යවස්ථාදායකය හා අධිකරණය අතර අනවශ්‍ය ගැටුමක් ඇති කිරීමට හේතු විය හැකි බවද එය බරපතල හා විනාශකාරී ප්‍රතිවිපාකයන් ඇති විය හැකි කොන්දේසි විරහිතව පරාජය කළ යුතු තත්ත්වයක් බවද අපගේ නිරීක්ෂණය වේ. අධිකරණ අමාත්‍යවරයා රටේ අධිකරණ පද්ධතියේ විශ්වාසය අහිමි කරගත් වගකීම් විරහිත පුද්ගලයෙකු බවට පත්වීම කෙරෙහි අපි බෙහෙවින් කනස්සල්ලට පත්ව සිටිමු.

ශිෂ්ඨ සම්පන්න සමාජයක් උදෙසා ස්වාධීන අධිකරණයක පැවැත්ම ආරක්ෂා කර ගැනීම සෑම පුරවැසියෙකුටම ඇති අත්හල නොහැකි හා සාමූහික වගකීමක් වේ. එහිදී පුරවැසියාගේ පරමාධිපත්‍යය බලතල ක්‍රියාත්මක කරන ප්‍රධාන ආයතන ත්‍රිත්වය එකිනෙකාගේ වගකීම් හා ගෞරවය කෙරෙහි අවබෝධයෙන් ක්‍රියා කිරීමට සමත් පුද්ගලයින්ගෙන් සංගෘහිත විය යුතුය. ඒවායේ සාමාජිකයින් වගකීම් විරහිතව පුද්ගලික අවශ්‍යතා මත අනිකා කෙරෙහි වෛරී ආකල්පයකින් ක්‍රියා කරන තත්ත්වයකට පත් වුවහොත් එයම පාරාවළල්ලක් වී ආයතන ත්‍රිත්වය කෙරෙහිම මහජන විශ්වාසය ක්‍රමිකව බිඳ වැටීම වැළැක්විය නොහැක. අධිකරණ අමාත්‍යවරයාගේ වගකීම් විරහිත ප්‍රකාශයන්හි අවසන් ප්‍රතිඵලය එය විය හැකි බවට අප සංගමය පාලන ක්‍රමයේ වැදගත් වගකීම් දරණ සියලු පාර්ශ්වයන්ට අනතුරු අඟවන්නෙමු.

රුවන් දිසානායක,
සභාපති,
අධිකරණ සේවා සංගමය.
ඩී.එම්.රුවන් ධම්මික දිසානායක
දිසා විනිසුරු
දිසා අධිකරණය
කෑගල්ල.

ඉසුරු නෙත්තිකුමාරගේ,
ලේකම්,
අධිකරණ සේවා සංගමය.
ඉසුරු නෙත්තිකුමාරගේ
මහේස්ත්‍රාත්
ගාල්ල

2024.06.24 වන දිනදීය.